**ශ්‍රී ලංකා මහ බැංකුව - 2021**

**-------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් සහ සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තියේ සහ මුදල් නීති පනතේ 42(2) වගන්තියේ (422 අධිකාරිය) ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදී.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යයසාධනය සහ මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRSs) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිතීන් යටතේ මාගේ වගකීම් මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම් කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය බැංකුව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා බැංකුව විසින් පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස බැංකුවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ මුදල් මණ්ඩලය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ බැංකුවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව බැංකුව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව බැංකුව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව බැංකුව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව, සමාලෝචිත වර්ෂයේ බැංකුවේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. බිලියන 158.2 ක ශුද්ධ ලාභයක් වූ අතර ඊට සාපේක්ෂව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. බිලියන 63.4 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. බිලියන 94.8 ක වර්ධනයක් පිළිබිඹු විය. විදේශීය මූල්‍ය ආයෝජන ආදායම හා දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ශුද්ධ ආදායම වැඩි වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ බැංකුවේ ප්‍රධාන ආදායම් විෂයයන් සහ ප්‍රධාන වියදම් විෂයයන්, ඉකුත් වර්ෂය සමඟ සසඳා විශ්ලේෂණය කර පහත දක්වා ඇත.

| | 2021 | 2020 | විචලනය {හිතකර/(අහිතකර)} | |
|---|---|---|---|---|
| | රු. බිලියන | රු. බිලියන | රු. බිලියන | ප්‍රතිශතය % |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | **68.5** | **56.3** | **12.2** | **21.6** |
| පොලී ආදායම | 11.8 | 26.2 | (11.4) | (54.9) |
| උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන ලාභය / (අලාභය) | 41.8 | 23.5 | 18.3 | 77.8 |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වූ ලාභය /(අලාභය) | 14.8 | 6.5 | 8.3 | 127.6 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | **3.3** | **7.3** | **4.0** | **54.7** |
| පොලී වියදම | 5.6 | 5.3 | (0.3) | (5.6) |
| අපේක්ෂිත ණය අලාභ | 2.2 | (2.0) | 4.2 | 210.0 |
| **ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය / (අලාභය)** | **34.0** | **7.1** | **26.9** | **378.4** |
| **දේශීය මූල්‍ය වත්කම්වලින් ලද සමස්ථ ශුද්ධ ආදායම / (වියදම)** | **58.9** | **16.9** | **42.0** | **248.5** |
| **වෙනත් ආදායම්** | **16.2** | **1.6** | **14.6** | **912.5** |
| **මෙහෙයුම් වියදම්** | **16.3** | **11.2** | **(5.1)** | **(45.5)** |
| **බදු** | **-** | **-** | **-** | **-** |
| **වර්ෂය සඳහා ලාභය (අලාභය)** | **158.2** | **63.4** | **94.8** | **149.5** |

(අ) මුදල් නීති පනතේ 41 වන වගන්තියට අනුව, බැංකුවේ වාර්ෂික ලාභ හා අලාභ ගණනය කිරීමේදී, විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභ හෝ අලාභ ඇතුළත් නොකළ යුතුය. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා වූ ලාභය රු. බිලියන 124.2 ක් වූ අතර (ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය රු. බිලියන 34.0 ක් හැර) ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ ලාභය රු. බිලියන 56.3 ක් වූයෙන් (ශුද්ධ විදේශ විනිමය

ප්‍රත්‍යාගණන අලාභය රු. බිලියන 7.1 ක් හැර) ලාභයේ රු. බිලියන 67.9 ක වර්ධනයක් පිළිබිඹු විය.

(ආ) මුදල් නීති පනතේ 38 සහ 41 වැනි වගන්ති හා මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද බැංකුවේ ලාභ බෙදා හැරීමේ ප්‍රතිපත්තියට (2018 වර්ෂයේ සිට බලාත්මක) අනුව තීරණය කරන ලද සමාලෝචිත වර්ෂයේ බෙදා හැරිය හැකි ලාභය රු.බිලියන 74.6 ක් වූ අතර ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ බෙදා හැරිය හැකි ලාභය රු.බිලියන 18.6 ක් විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ බෙදා හැරිය හැකි ලාභයෙන් රු. බිලියන 30 ක් හෙවත් සියයට 40.0 ක් ඒකාබද්ධ අරමුදලට බෙදා හැර තිබුණු අතර ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේදී රු. බිලියන 15 ක් ඒකාබද්ධ අරමුදලට බෙදා හැර තිබුණි.

## 2.3 බැංකුවේ ශේෂපත්‍ර අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) බැංකුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, බැංකුව සතුව ඇති භාණ්ඩාගාර බිල්පත් තොගයේ වටිනාකම 2020 වර්ෂය අවසානයට පැවති රු. බිලියන 638 (පොත් අගය) සිට 2021 වර්ෂය අවසාන වන විට රු.බිලියන1,351(පොත් අගය) දක්වා වැඩිවිය. එය 2018 හා 2019 වර්ෂ අවසාන විට පිළිවෙලින් රු.බිලියන 43 (පොත් අගය) ක් හා රු.බිලියන 25 (පොත් අගය) ක් විය. ඒ අනුව, බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගයේ වටිනාකම, රජය විසින් නිකුත් කර ඇති භාණ්ඩාගාර බිල්පත් තොගයෙන් 2020 වර්ෂය අවසාන වන විට සියයට 40.4 සිට 2021 වර්ෂය අවසාන වන විට සියයට 59.5 දක්වා වැඩිවිය. එය 2019 වර්ෂය අවසානයට සියයට 2.9 ක්ව පැවතුණි.

(ආ) 2021 ජූලි 26 දින කල්පිරෙන ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය පියවීම පිණිස ඇමෙරිකානු ඩොලර් මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකා රුපියල් අවශ්‍යතාවය සැපිරීමට මහ බැංකුවට භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරන ලෙස භාණ්ඩාගාර ලේකම් විසින් 2021 ජූලි 22 දිනැති ලිපියකින් බැංකුවෙන් ඉල්ලීමක් කර තිබුණි. මහ බැංකුවට රු.බිලියන 60 ක් වටිනා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීමට 2021 ජූලි 30 දින භාණ්ඩාගාර ලේකම් විසින් තවත් ඉල්ලීමක් කර තිබුණි. මෙම ඉල්ලීම් සුවිශේෂී තත්වයන් යටතේ ජාතික වැදගත්කම අනුව ඉටුකිරීමට තීරණය කළ බව බැංකුව භාණ්ඩාගාර ලේකම් වෙත දන්වා තිබුණි.

(ඇ) දේශීය මූල්‍ය වත්කම්වල වටිනාකම 2020 වර්ෂය අවසානයට පැවති රු.බිලියන 1,006.5 සිට 2021 වර්ෂය අවසානයට රු.බිලියන 2,271.7 හෙවත් සියයට 120.7 දක්වා සැලකිය යුතු ලෙස වැඩිවී තිබුණි. අතැති භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම රු.බිලියන 663.3 කින් වැඩිවීමත් සමඟ ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලදී ගත් සුරකුම්පත්වල වටිනාකම රු.බිලියන 564.8 කින් වැඩිවීම එයට ප්‍රධාන හේතු විය. මුදල් මණ්ඩලය, 2018 අප්‍රේල් 24 දින පැවති එහි රැස්වීමේදී ගන්නා ලද තීරණය පරිදි, විචක්ෂණ හිමිකම් (Prudential Equity) දේශීය වත්කම්වලට අනුපාතය සියයට 25 ක් විය යුතුය. කෙසේ වෙතත්, විචක්ෂණ හිමිකම් දේශීය වත්කම්වලට අනුපාතය 2021 දෙසැම්බර් 31 දිනට සියයට 10.8 දක්වා පහත වැටුණු අතර 2022 මැයි මස අවසානයට සියයට 6.75 ක් විය. තවද, මුදල් නීති පනතේ 39(බී) වගන්තියට අනුව, ව්‍යවස්ථාපිත හිමිකම් දේශීය වත්කම්වලට අනුපාතය සියයට 15 ක් විය යුතුය. 2021 වර්ෂය අවසානයට මෙම අනුපාතය සියයට 20.6 ක් වූ අතර 2022 මැයි මස අවසාන වනවිට සෘණ සියයට 5.8 ක් විය.

(ඈ) බැංකුවේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට අනුව, බැංකුවේ විදේශ වත්කම්වල වටිනාකම 2020 වර්ෂය අවසානයට පැවති රු. බිලියන 1,387.5 සිට 2021 වර්ෂය අවසාන වන විට රු.බිලියන 798.8 දක්වා සියයට 42 කින් අඩුවී තිබුණි. එය 2019 වර්ෂය අවසාන වන විට රු.බිලියන 1,511.6 ක් විය. බැංකුව විසින් ප්‍රසිද්ධ කරනු ලබන සතිපතා වාර්තා අනුව, 2021 අගෝස්තු මාසයේදී බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් රු.බිලියන 83.9 ක සෘණ ශේෂයක් වාර්තා කිරීම ආරම්භ කර තිබුණි. බැංකුවේ වාර්ෂික වාර්තාව අනුව, 2021 දෙසැම්බර් අවසාන වන විට මෙම සෘණ ශේෂය රු.බිලියන 387.3 දක්වා වැඩිවී තිබුණි. තවද, 2022 ජූලි අවසාන වන විට සෘණ ශුද්ධ විදේශ වත්කම්වල ශේෂය රු.බිලියන 1,686.2 දක්වා වැඩිවී තිබුණි. 2020 වර්ෂය අවසාන වන විට බැංකුවේ ශුද්ධ විදේශ වත්කම් රු.බිලියන 526.8 ක් ලෙස වාර්තා විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යන සමාගම්වලට බලපත්‍ර නිකුත් කිරීම, නියාමනය සහ අධීක්ෂණය, 2016 ජුලි 15 දින සිට බලපැවැත්වෙන පරිදි 2016 අංක 06 දරණ ක්ෂුද්‍ර මූල්‍ය පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් සිදු කරනු ලබයි. තැන්පතු භාර ගන්නා සහ ප්‍රධාන වශයෙන් අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් (ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර) මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගත යුතුය. ඒ අනුව, මෙම පනත බලපැවැත්වෙන දින සිට 2021 ජුනි 30 දක්වා ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපාර කරගෙන යාම සඳහා සමාගම් හතරක් පමණක් බලපත්‍ර ලබාගෙන තිබුණි. තැන්පතු භාර නොගන්නා නමුත් රට තුළ සිටින අඩු ආදායම්ලාභීන්ට හා ක්ෂුද්‍ර ව්‍යවසායයන්ට මූල්‍ය සේවා සපයන සමාගම් මෙම පනත යටතේ බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය නොවේ. එබැවින් එවැනි සමාගම්, මෙම පනත යටතේ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නියාමනය හා අධීක්ෂණය නොකරනු ලබයි.<br>2019 වර්ෂයේ විගණකාධිපති වාර්තාවට ප්‍රතිචාර වශයෙන්, ක්ෂුද්‍ර මූල්‍ය හා මුදල් ණය දෙන ව්‍යාපාරවල නියැලී සිටින ආයතනවලට බලපත්‍ර ලබා දීම, නියාමනය කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා ණය නියාමන අධිකාරියක් වෙනම පනතක් හරහා ස්ථාපිත කරන බවත් එම යෝජිත පනතෙහි කෙටුම්පත 2019 නොවැම්බර් 26 දින මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කර ඇති බවත් සඳහන් කරන ලදි. කෙසේ වෙතත්, 2021 වර්ෂය අවසාන වන විටත් එය බලාත්මක කර නොතිබුණි. | යෝජිත ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන පනත හරහා ක්ෂුද්‍ර මූල්‍ය හා මුදල් ණයදෙන ව්‍යාපාරයේ යෙදී සිටින ආයතනවලට බලපත්‍ර ලබාදීම, නියාමනය හා අධීක්ෂණය කිරීමට ක්ෂුද්‍ර මූල්‍ය හා ණය නියාමන අධිකාරිය ස්ථාපිත කිරීමට යෝජනා කර ඇත. මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද යෝජිත පනතේ කෙටුම්පත 2019 නොවැම්බර් 26 දින මුදල් අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදි. කෙසේ වෙතත්, රජය වෙනස්වීම හේතුවෙන්, 2021.03.23 දින එම පනත කෙටුම්පත් කිරීමට නීති කෙටුම්පත් සම්පාදකට උපදෙස් දෙමින් කැබිනට් මණ්ඩලයෙන් නව අනුමැතියක් ලබා ගන්නා ලදි. බැංකුව, 2021.11.23 දින එම පනතේ පළමු කෙටුම්පත සඳහා එහි නිරීක්ෂණ මුදල් අමාත්‍යාංශයට ලබා දෙන ලදි. යෝජිත පනත බලාත්මක කිරීමේ ක්‍රියාවලිය සඳහා නීති කෙටුම්පත් සම්පාදක, නීතිපති දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය සහ බැංකුව ඇතුළු පාර්ශව කිහිපයක් සම්බන්ධ වන අතර එබැවින්, බැංකුවේ සම්පූර්ණ පාලනය යටතේම නොපවතියි. | සියලු සම්බන්ධිත පාර්ශවවල සහයෝගය ඇතිව ක්‍රියාවලිය කඩිනම් කිරීම අවශ්‍ය වේ. |

### 3.2 බැංකුවේ අධිපතිවරයා වෙත විශ්‍රාම වැටුප් ගෙවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1997.12.31 හෝ ඊට පෙර බැංකුවට බඳවා ගන්නා ලද සේවකයන් සඳහා බැංකුවට විශ්‍රාම වැටුප් ක්‍රමයක් (පැරණි විශ්‍රාම වැටුප් ක්‍රමය) පැවතුණු අතර 1997.12.01 දිනැති මුදල් මණ්ඩල තීරණය අනුව, රජයේ ප්‍රත්පත්තියට අනුකූල වෙමින්, 1998.01.01 දින හෝ එදිනට පසු බැංකුවේ සේවයට සම්බන්ධ වූ සේවකයන් සඳහා දායකත්ව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ප්‍රදානය කරමින් බැංකුවේ | විශ්‍රාම වැටුපකට අධිපතිවරයාගේ හිමිකම 1968 වර්ෂයේ සිටම හඳුනාගෙන තිබුණු අතර ගරු නීතිපතිතුමා විසින් ද එය නිල වශයෙන් තහවුරු කර ඇත. ඉහත සඳහන් කරන ලද විස්තරාත්මක කරුණු අනුව, "නව විශ්‍රාම ප්‍රතිලාභ යටතේ අධිපති ලෙස පත්කරනු ලබන පුද්ගලයකු සඳහා විශ්‍රාම ප්‍රතිලාභ සඳහා රීති ස්ථාපිත කිරීම" යන | විශ්‍රාම ප්‍රතිලාභ ලැබීමට අවම සේවා කාලයක් ඇතුළත් කිරීම අවශ්‍ය වේ. |

විශ්‍රාම වැටුප් අරමුදල් රීති සංශෝධනය කිරීමට තීරණය කරන ලදි. පැරණි විශ්‍රාම වැටුප් ක්‍රමයේ 3(සී) රීතිය අනුව, බැංකුවේ අධිපතිවරයා 1997.12.31 දිනය දක්වා විශ්‍රාම ප්‍රතිලාභවලට හිමිකම් ලැබීය.

**(ආ)** මුදල් මණ්ඩලය 2015.05.08 දින පැවති එහි රැස්වීමේදී 1998.01.01 දින හෝ ඊට පසුව බැංකුවට පත්කරන ලද බැංකුවේ සේවකයන් වෙනුවෙන් නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් අගමැතිතුමාගේ හා මුදල් ඇමතිතුමාගේ එකඟතාවය අනුව ක්‍රියාත්මක කිරීමට, මූලිකව තීරණය කරන ලදි. නව විශ්‍රාම වැටුප් ක්‍රමය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට 2015.05.21 දින පැවති රැස්වීමේදී මුදල් මණ්ඩලය අනුමත කර තිබුණු අතර 2016.10.17 දින පැවති රැස්වීමේදී නව විශ්‍රාම වැටුප් ක්‍රමයට අදාල රීති අනුමත කරන ලදි. ඒ අනුව, උපරිම විශ්‍රාම හිමිකම, බැංකුවේ වසර 42 ක් හෝ ඊට වඩා වැඩි සේවාකාලයක් ඇති සේවකයන් සඳහා විශ්‍රාම වැටුප් පදනමෙන් සියයට 74 ක් විය. නව විශ්‍රාම වැටුප් රීතිවලට අධිපතිවරයාගේ විශ්‍රාම වැටුප ඇතුළත් කිරීම, බැංකුවේ එවකට හිටපු අධිපතිවරයාගේ ඉල්ලීම පරිදි විලම්බනය කිරීමට මුදල් මණ්ඩලය එම රැස්වීමේදීම තීරණය කරන ලදි. ඒ අනුව, 1998.01.01 හෝ ඊට පසුව පත්කරන ලද අධිපතිට බැංකුවේ විශ්‍රාම ප්‍රතිලාභවලට හිමිකම් නොවීය.

**(ඇ)** මුදල් මණ්ඩලය 2019.07.30 දින පැවති එහි රැස්වීමේදී, අධිපතිවරයාගේ විශ්‍රාම වැටුප සම්බන්ධ කාරණය, අධිපතිවරයාගේ වැටුප් හා විශ්‍රාම වැටුප් පත්කිරීමේ අධිකාරිය විසින් තීරණය කළ යුතු කරුණු හෙයින් ජනාධිපති ලේකම්වරයාට යොමු කරන ලෙස මානව සම්පත් අධ්‍යක්ෂවරයාට උපදෙස් දෙන ලදි. ඒ අනුව, එවකට අධිපති 2019.10.15 දිනැති ලිපියක් මඟින් මෙම කාරණය ජනාධිපති ලේකම්වරයාගේ අවධාණයට යොමු කරන ලදි. 2020.11.09 දින පැවති ආයතනික කළමනාකරණ කමිටු රැස්වීමේදී, බැංකුවේ අධිපතිවශයෙන් පත්කරන ලද තැනැත්තකු වෙනුවෙන් විශ්‍රාම ප්‍රතිලාභ සඳහා නව විශ්‍රාම ක්‍රමයට රීති ඇතුළත් කිරීමට නිර්දේශ කර තිබුණි. ඒ සඳහා, එවකට ජනාධිපති ලේකම්වරයා විසින් අධිපතිවරයා අමතන ලද 2020.09.02 දිනැතිව යොමුකර ඇති ලිපියක් මඟින් බැංකුවේ අධිපති මාතෘකාව යටතේ, අදාල රීති අනුව අධිපතිවරයෙකු විශ්‍රාම වැටුපකට හිමිකම් ලබනවාද යන්න පමණක් සැලකිල්ලට ගත යුතු වේ. පත්වීම් ලිපියේ හෝ වෙනත් යමක හෝ තිබිය යුතු හෝ සම්පූර්ණ කළ යුතු වෙනත් කාරණයක් නීතිපතිතුමා සඳහන් කර නොමැත. විශ්‍රාම වැටුප් කාර්යය සඳහා අධිපතිවරයකු මහබැංකුවේ නිලධාරියෙක් වශයෙන් සැලකෙන නිසා විශ්‍රාම වැටුපට සුදුසුකම් ලබයි. මෙම මූලධර්මය 1968 පටන් ස්ථාපිත සම්මතය වේ. මෙම තත්වය යටතේ, හිටපු අධිපතිවරයකුගේ පත්වීම් ලිපියෙහි විශ්‍රාම වැටුප් ගැන සඳහන් නොවුව ද, පැහැදිලිව ස්ථාපිත පොදු මූලධර්මය හා ප්‍රස්තුතය අනුව සහ නීතිපතිතුමා විසින් හඳුනාගත් තාර්කිකත්වය අනුව, විශ්‍රාම වැටුප් සම්බන්ධ කාර්යාලය බව පැහැදිලි වේ. (It clearly appears that it is the office that attracts the pension)

“නව විශ්‍රාම වැටුප් ක්‍රමය යටතේ බැංකුවේ අධිපති ලෙස පත්කරනු ලබන පුද්ගලයා වෙනුවෙන් විශ්‍රාම ප්‍රතිලාභ සඳහා රීතිවල, හිටපු අධිපතිවරයකුට එරෙහිව යම් අපරාධ විමර්ශනය හෝ අපේක්ෂිත නීති ක්‍රියාමාර්ග පවතින්නේද යන්න පමණක් නුසුදුසුකමක් ලෙස සලකන අතර එවැනි අවස්ථාවකදී විශ්‍රාම ගෙවීම් කිරීම හෝ තාවකාලිකව නතර කර, එම නීති ක්‍රියාමාර්ග මඟින් වරදකරුවෙකු වුවහොත් සම්පූර්ණ හිමිකමෙන් තොර වේ.

තනතුර සම්බන්ධව හටගෙන ඇති විශ්‍රාම වැටුප් විෂමතාවය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස කරන ලද ඉල්ලීම සැලකිල්ලට ගන්නා ලදි. 1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 12 වන වගන්තිය පරිදි, ජනාධිපතිවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි යම් වැටුපක් අධිපතිවරයා ලැබිය යුතුය. කෙසේ වෙතත්, අධිපතිවරයා පත්කිරීමේ අධිකාරිය මුදල් විෂය බාර ආමාත්‍යවරයාගේ නිර්දේශය මත ජනාධිපතිවරයා නිසා, ඉහත දක්වන ලද ලිපියෙහි බැංකුවේ අධිපති තනතුර සම්බන්ධව විශ්‍රාම වැටුප් විෂමතාවය නිවැරදි කිරීමට ජනාධිපතිවරයාගේ යම් එකඟතාවයක් සම්බන්ධව සඳහන් වී නොතිබුණි. තවද, විශ්‍රාම ප්‍රතිලාභ සඳහා හිමිකම් ලැබීමට බැංකුවේ අධිපතිවරයා ලෙස සේවය කළ යුතු අවම කාලයක් අධිපතිවරයාට සම්බන්ධ විශ්‍රාම රීතිවල දක්වා නොතිබුණි. පිළිවෙලින් 2004-2006 හා 2016-2019 කාලවල බැංකුවේ අධිපතිධූරය හෙබවූ අධිපතිවරුන් දෙදෙනෙකු ඔවුන්ට ප්‍රදානය කරන ලද ඔවුන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ ලබාගැනීමට අකමැති බව බැංකුවට දන්වා තිබුණි.

## 3.3 බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් නීති පනතේ 113 වගන්තිය ප්‍රකාරව, සෘජු ලංසු ඉදිරිපත් කළ හැකි භාණ්ඩාගාර බිල්පත් සම්බන්ධයෙන් හැර, බැංකුව යම් සුරැකුම්පත් නිකුතුවක මිලදී ගැනීම හෝ එවැනි යම් සුරැකුම්පත් නිකුතුවක මිලදී නොගත් කොටස මිලට ගැනීම නොකළ යුතුය. එසේම, එම පනතේම 90(2) වගන්තිය අනුව, රජයේ සුරැකුම්පත් සම්බන්ධව විවට වෙළඳපළ කටයුතු සිදු කිරීමේදී, බැංකුව එහි ණය සංකෝචනය කිරීමට වඩාත් හැකිවනු පිණිස, එවැනි සංකෝචනයක් අත්‍යවශ්‍ය වන්නේ නම්, ප්‍රමාණවත් කෙටිකාලීන සුරැකුම්පත් තොගයක් පවත්වා ගැනීමේ අවශ්‍යතාවය සඳහා බැංකුව සැලකිලිමත් විය යුතුය. ඒ අනුව, ප්‍රධාන වශයෙන්ම අයවැය හිඟය පියවීම හා ණය සේවාකරණ වගකීම් සපුරාලීමේ අරමුණින් 2020 මාර්තු සිට 2022 පෙබරවාරි දක්වා කාල පරිච්ඡේදය තුළදී බැංකුව රු.බිලියන 3,423,4 ක් (පොත් අගය) වටිනා භාණ්ඩාගාර බිල්පත් මිලදී ගෙන තිබුණි. 2021 අගෝස්තු 1 දින බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද ලිපියට අනුව, අඛණ්ඩ මුදල් | අයවැය හිඟය පියවීම සඳහා අවම මුදල් මූල්‍යකරණයේ හෝ මිලදී නොගැනීමේ වාසි හඳුනා ගැනීම, සමාලෝචනය කරන අතර, ආර්ථිකයේ සුවිශේෂී සාර්ව ආර්ථික තත්වයන්, ජාතික අවශ්‍යතාවය, අයවැය අරමුණුවල අඩු කාර්ය සාධනය හේතුවෙන් රජයේ දැරිය නොහැකි ණය සේවාකරණ පිරිවැයද, ප්‍රතිපත්ති අවශ්‍යතාවය හා ඉහළ යන අවිනිශ්චිතතාවයන් හේතුවෙන් පොලී අනුපාතවල තියුණු ලෙස ඉහළට ගැලපීම් සැලකිල්ලට ගෙන, අභියෝගාත්මක මුදල් රැස් කිරීමේ තත්වයන් බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමෙන් සනාථ කරයි. මෙම කරුණු මුදල් මණ්ඩලය විසින් දැඩිව පැහැදිලි කර ඇති අතර | මූල්‍ය ප්‍රතිපත්තියේ අරමුණ සඳහා බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීම සීමා කිරීම අවශ්‍ය වේ. |

| | | |
|---|---|---|
| මූල්‍යකරණය සහ එහි ප්‍රතිඵලයක් ලෙස සංචිත මුදල්, දේශීය මිල ස්ථායීතාවයට තර්ජනයක් වී ඇති අතර එය සීමා කිරීම් නොතකා ආනයන සඳහා ඉහළ ඉල්ලුම හරහා බාහිර වෙළඳ ගිණුමට හා ගෙවුම් ශේෂයට, අහිතකර ලෙස බලපා ඇත. කෙසේ වෙතත්, මුදල් නීති පනත අනුව, රජයේ ණය සේවා වගකීම් සැපිරීමට එයට පහසුකම් සැලසීමට නොව මූල්‍ය ප්‍රතිපත්තියේ අරමුණ සඳහා පමණක් බැංකුවට භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමට අවසර දී ඇත. | අවස්ථෝචිත වෙළඳපල තත්වයන් යටතේ මහ බැංකුව සතු තොගය ක්‍රමිකව අඩු කිරීමට කටයුතු සූදානම් කර ඇත. | |

## 3.4 බැංකුව විසින් ස්ථාවර විනිමය අනුපාත ප්‍රතිපත්තියක් පවත්වාගෙන යාම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බැංකුව විසින් ප්‍රසිද්ධ කරනු ලබන දිනපතා විනිමය අනුපාත අනුව, එක්සත් ජනපද ඩොලරයක විනිමය අනුපාතය 2021 සැප්තැම්බර් සිට 2022 මාර්තු 7 දක්වා ස්ථාවර අනුපාතයක (රු.202.9992) පවත්වාගෙන ගොස් තිබුණි. කෙසේ වෙතත්, 2021 අගෝස්තු 18 දින මූල්‍ය ප්‍රතිපත්ති සමාලෝචන අංක 6 සඳහා පැවති රැස්වීමේදී, 2021 අප්‍රේල් සිට ඉහළ ප්‍රමාණයේ ශිෂ්ට ප්‍රයෝග හරහා විනිමය අනුපාතය එක්සත් ජනපද ඩොලරයට රු.199.90 ක අගයක තීරණය වන බව සඳහන් විය. | ඉහත කොටසේ සඳහන් කරන ලද විනිමය අනුපාත නියමානුකූල වේ. | සියලු අවස්ථාවලදී මිල ස්ථායිතාවය ළඟා කර ගැනීමට විනිමය අනුපාත සුදුසු මට්ටමේ පවත්වා ගැනීම අවශ්‍ය වේ. |
| (ආ) 2021 අගෝස්තු 4 දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී, (රැස්වීම් අංක 27/2021), අපනයනකරුවන් ඔවුන්ගේ අපනයන ඉපයීම්වලින් සියයට 25 ක් රුපියල්වලට පරිවර්තනය කිරීම අවශ්‍ය බව සඳහන් විය. නමුත්, විදේශීය විනිමය තැන්පතු අනුපාත රුපියල් තැන්පතු අනුපාතවලට වඩා වැඩි බැවින් සහ රුපියල ක්ෂය වීම අපේක්ෂාවෙන් ඔවුන් අපනයන ඉපයීම් පරිවර්තනය කිරීමට අකමැත්තක් දක්වයි. තවද, විනිමය අනුපාතයේ පවත්නා ප්‍රධාන ගැටළුව විසඳීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදි. කෙසේ වෙතත්, විනිමය අනුපාතය ක්ෂය විමට ඉඩ හැරීමට රජය පාර්ශවයේ අකමැත්ත පිළිබඳව එක් මුදල් මණ්ඩල සාමාජිකයකු භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් විමසූ විට, භාණ්ඩාගාර ලේකම්වරයා සඳහන් කර ඇත්තේ, විනිමය අනුපාතය නිදහසේ උච්චාවචනය වීමට ඉඩ දෙන්නේ නම් හදිසියේ විශාල ක්ෂය වීමක් | 2021 ජුලි 1 දින, ගෙවුම් ශේෂ හා වෙනත් ගැටළුවලට සම්බන්ධ තත්වය කඩිනමින් විසඳීම පිණිස මුදල් මණ්ඩලය හා බැංකුව අග්‍රාමාත්‍යවරයා ද වන මුදල් ඇමතිවරයා වෙත විශේෂ, විස්තරාත්මක පරිපූර්ණ ඉදිරිපත් කිරීමක් කරන ලදි.<br>මෙම රැස්වීමේදී, විශේෂ යෝජනා ඇතුළත් බහු ආංශික උපායමාර්ගයක් මුදල් ඇමතිවරයාට/ අගමැතිවරයාට ඉදිරිපත් කරන ලදි. සමහර අදහස් ප්‍රකාශ වුනු අතරම, බැංකුව විසින් කරන ලද විවිධ යෝජනා හා උපාය මාර්ග අතුරින් කිහිපයකට පමණක් එම රැස්වීමේදී එකඟතාවය ලබා ගත හැකි විය.<br>ඉන් පසුව, මුදල් මණ්ඩලය 2021.08.04 දින පැවති එහි රැස්වීමේදී, ක්‍රමිකව විනිමය අනුපාතය ක්ෂය කිරීමක් සඳහා දැඩි අවස්ථාවක් පවතින බව මුදල් මණ්ඩලයට පත්කළ සාමාජිකයන් දෙදෙනා එම රැස්වීමේ අවස්ථා ගණනාවකදීම, විශේෂයෙන් සඳහන් කරන ලදි. | සියලු අවස්ථාවලදී මිල ස්ථායිතාවය ළඟා කර ගැනීමට විනිමය අනුපාත සුදුසු මට්ටමේ පවත්වා ගැනීම අවශ්‍ය වේ. |

විය හැකි අතර එය ගැටළු රාශියක් ඇති කළ හැකි බවයි. මෙම ගැටළුව විසඳිය හැකි එකම ක්‍රමය වන්නේ හැකි තරම් ඉක්මනින් ප්‍රමාණවත් ගලා ඒම් පැවතීමයි. අධිපතිවරයා දක්වා ඇත්තේ විනිමය අනුපාත ගැටළුව අමාත්‍යවරයා සමඟ ද සාකච්ඡා කළ බවත්, අමාත්‍යවරයා බැංකුවෙන් එය ලිඛිතව (write up) ඉල්ලා සිටි බවත්, රුපියලේ යම් ක්ෂය වීමකට ඉඩ දීම සඳහා දේශපාලන කැමැත්ත තක්සේරු කිරීමට ඔහුගේ දේශපාලන හිතවතුන් සමඟ සාකච්ඡාවක් සඳහා එය භාවිතා කිරීමට හැකි බවත්ය.

මුදල් අමාත්‍යවරයා විසින් 2021.08.12 දිනැතිව "කෙටිකාලීන සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග" මැයෙන් ලිපියක් බැංකුවට එවන ලදි. එම ලිපියෙහි ඇතුළත් විශේෂිත ක්‍රියාමාර්ග අතුරින් එකක් වන්නේ එක්සත් ජනපද ඩොලරය සඳහා විකුණුම් අනුපාතය 202 නොඉක්මවන පරිදි එක් එක් වාණිජ බැංකුවට උපදෙස් දෙන ලෙසයි. ප්‍රතිපත්ති පොලී අනුපාත පදනම් අංක 50 කින් ඉහළ දැමීමට ද යෝජනාවක් තිබුණි. මුදල් මණ්ඩලය 2021.09.14 , 2021.11.11, 2021.12.09, 2022.01.27 හා 2022.02 28 දිනැති ව්‍යවස්ථාපිත වාර්තා නිකුත් කරමින් රටේ විනිමය අනුපාත තත්වය සම්බන්ධ කරුණු මුදල් ඇමතිවරයාට දන්වන ලදි.

(ඇ) 2021 අගෝස්තු 18 දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී, වෙළඳපල තත්වයන්ට අනුකූලව විනිමය අනුපාතය ගැලපීමට ඉඩදීමත්, අධික විචලනය සීමා කිරීමට ශිෂ්ට ප්‍රයෝග යොදා ගැනීමත් සම්බන්ධව තව දුරටත් අධිපතිවරයා රජය සමඟ සාකච්ඡා කිරීමටත් අනුමැතිය දෙන ලදි. කෙසේ වෙතත්, වෙළඳපලට අනුකූලව විනිමය අනුපාතය ගැලපීමට ඉඩදීමේ තීරණය 2022 මාර්තු වන තුරු ගෙන නොතිබුණි.

(ඈ) 2020 වර්ෂයේදී එක්සත් ජනපද ඩොලර් මිලියන 7,103.9 ක්ව පැවති විදේශ ශ්‍රමික ප්‍රේෂණ 2021 වර්ෂයේදී එක්සත් ජනපද ඩොලර් මිලියන 5,491.5 දක්වා පහත බැස තිබුණි. තවද, 2021 පෙබරවාරි සිට 2021 අගෝස්තු දක්වා වන මාස 7 ක කාලය තුළ විදේශ ශ්‍රමික ප්‍රේෂණ එක්සත් ජනපද ඩොලර් මිලියන 3,549.0 ක් වූ අතර 2021 සැප්තැම්බර් සිට 2022 මාර්තු දක්වා එය එක්සත් ජනපද ඩොලර් මිලියන 2,049.7 ක් විය. ඒ අනුව, නිල විනිමය අනුපාතයට සාපේක්ෂව අවිධිමත් වෙළඳපලේ විනිමය අනුපාතයේ කැපී පෙනෙන වෙනසක් දැක්වීම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන විධිමත් මාර්ග හරහා ලැබෙන ප්‍රේෂණ අඩු වී ඇති බව නිරීක්ෂණය විය.

2021 අගෝස්තු මූල්‍ය ප්‍රතිපත්ති චක්‍ර අංක 6 ට අදාල මූල්‍ය ප්‍රතිපත්ති තත්වය සමාලෝචනය කිරීමේ සටහන්වලට අනුව, "බැංකු විසින් ප්‍රකාශ කරන විනිමය අනුපාතය හා අවිධිමත් වෙළඳපල අතර විශාල විෂමතාවය නිල වශයෙන් වාර්තා වූ ශ්‍රමික ප්‍රේෂණ අඩුවීම සඳහා ප්‍රධාන හේතුවක් බව" සඳහන් කර ඇත.

සේවා ගිවිසුම් අවසන් වීම නිසා 2021 දී විදේශගත ශ්‍රමිකයන්ගේ ආපසු පැමිණීම විශාල ලෙස ඉහළ යාම, බැංකු හරහා ඔවුන්ගේ ඉපයීම් එවනවට වඩා මුදල් ලෙසම භෞතිකව ඔවුන් රැගෙන ඒම, වසංගත කාල පරිච්ඡේදය තුළ දී ශුද්ධ විදේශගතවීම් අඩු වීම වෙනත් විය හැකි හේතු වේ.

### 3.5 බැංකුව විසින් අඩු පොලී අනුපාත පවත්වාගෙන යැම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) භාණ්ඩාගාර ලේකම් 2020.04.08 දිනැති ලිපියකින් බැංකුවේ අධිපතිවරයාට දන්වා ඇත්තේ, මුදල් වෙළඳපල සියයට 7 ක පොලී අනුපාතයට ස්ථාවර වීම සඳහා ජනාධිපතිතුමා රාජ්‍ය බැංකු හා වෙනත් රජයට අයත් ව්‍යවසායන්ට/ ආයතනවලට භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්වල එක්ව ආයෝජනය කරන ලෙස උපදෙස් දී ඇති බව හා බැංකුවෙන් ඉල්ලා ඇත්තේ ඉහත සඳහන් ආයතනවලට අලාභ විය හැකි වන ඉහත සඳහන් අනුපාතවලට වඩා වැඩි අනුපාතවලට රජයේ සුරැකුම්පත් වෙන්දේසිවලදී ලංසු පිළි නොගත යුතු බවයි.<br>(ආ) 2020 අප්‍රේල් 3 දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී "දින 364 කින් කල් පිරෙන භාණ්ඩාගාර බිල්පතක පොලී අනුපාතය සියයට 7 කි වියයුතුය" යන කැබිනට් තීරණය සමඟ අනුගත වන ලෙසත්, දින 91 කින් හා 182 කින් කල් පිරෙන භාණ්ඩාගාර බිල්පත්වල පොලී අනුපාත ඒ අනුව තීරණය විය යුතු බවත් එම අනුපාත, භාණ්ඩාගාර බිල්පත් වලට ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම් වල පෙන්විය යුතු බවටත් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට උපදෙස් දෙන ලදි. දින 91 කින් හා 182 කින් කල්පිරෙන භාණ්ඩාගාර බිල්පත්වල සුදුසු උපරිම එලදා අනුපාත නිර්දේශ කරන ලෙසත් භාණ්ඩාගාර ලේකම්වරයාගෙන් හෝ ඔහු නම් කරන නිලධාරියකුගෙන් හෝ මුදල් ඇමතිවරයාගෙන් අනුමැතිය /එකඟතාවය ලබා ගන්නා ලෙසත් පසුව එම අනුපාත වෙන්දේසියට පෙර ප්‍රසිද්ධ කරන ලෙසත් මුදල් මණ්ඩලය 2020 මැයි 6 වන රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවට උපදෙස් දී තිබුණි.<br>(ඇ) 2021.08.04 දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී, අඩු පොලී අනුපාත පැවතීම මුදල් වෙළඳපලේ ද්‍රවශීලතා හිඟයකට බලපා ඇති බවත්, ඒ නිසා පද්ධතියට මුදල් දැමීමට බැංකුවට සිදු වී ඇති බවත් සඳහන් විය. එබැවින්, භාණ්ඩාගාර බිල්පත්වල මිල දී නොගත් විශාල ප්‍රමාණයක් බැංකුවට වෙන් කිරීමේ ගැටළුව විසඳෙනු ලබන, වෙළඳපොල තත්වයන්වලට අනුගත වන පරිදි පොලී අනුපාත ඉහළට ගැලපිය යුතු බව ඇතැම් මුදල් මණ්ඩල සාමාජිකයන් යෝජනා කර තිබුණි. බැංකුව 2021 අගෝස්තු සිට මුදල් ප්‍රතිපත්තිය දැඩි කිරීම ආරම්භ කර ඇති අතර 2021.08.18 සිට 2022.04.07 දක්වා කාල පරිච්ඡේදය තුළ පදනම් අංක 200 කින් ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාත (නිත්‍ය | මුදල් වෙළඳපලේ විශේෂයෙන්ම රාජ්‍ය බැංකු දෙකේ ද්‍රවශීලතා සීමා වීම් හේතුවෙන්, අදාල භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි වලදී මිලදී නොගත් කොටස බැංකුවට වෙන් කිරීමට අමතරව ප්‍රති මිලදී ගැනීමේ කවුළුව හරහා ණය ලබා දීමට බැංකුවට සිදු වන බව මුදල් මණ්ඩලය 2021.08.04 දින පැවති එහි රැස්වීමේදී නිරීක්ෂණය කරන ලදි. එම අවස්ථා දෙකෙහිදීම බැංකුව පද්ධතියට මුදල් නිකුත් කරන ලදි. බැංකු විසින් අධික පොලී අනුපාත යටතේ සමහර රුපියල් ණය ලබා දුන් අතර සුදුසු නියාමන ක්‍රියාමාර්ග හරහා ඒවා මැඩපැවැත්වීම අවශ්‍ය විය. ඊට අමතරව, රජයේ විශාල ණය අවශ්‍යතාවය නිසා, රජයේ සුරැකුම්පත්වල එලදා අනුපාත හා කෙටිකාලීන වෙළඳපල අනුපාතවල විෂම හැසිරීමක් දැක්විණි. ඒ අනුව, අහිතකර උද්ධමන අපේක්ෂාවන් මතුවීම වළක්වා ගැනීමටත්, වෙළඳපොල පොලී අනුපාත ව්‍යුහයේ නිරීක්ෂණය වූ විෂමතාවයන් නිවැරදි කිරීමට අවශ්‍ය ශක්තිය සැපයීමටත්, විනිමය අනුපාතය ස්ථාවර කිරීමටත් සැලකිය යුතු ප්‍රතිපත්ති ප්‍රතිචාරයන් අවශ්‍ය විය. එහිදී බැංකුව, 2021 අගෝස්තු මාසයේ පටන් මූල්‍ය ප්‍රතිපත්ති තත්වය දැඩි කිරිම ආරම්භ කරන ලදි.<br>භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සඳහා උපරිම පිළිගත හැකි එලදා අනුපාත නිවේදනය කිරීම නතර කිරීමට මුදල් මණ්ඩලය 2021.09.13 දින පැවති එහි රැස්වීමේදී තීරණය කළ අතර රජයේ සුරැකුම්පත් වෙළඳපලේ ඉල්ලුම හා සැපයුම මඟින් පොලී අනුපාතය තීරණය වන සාමාන්‍ය වෙන්දේසි ක්‍රමවේදයට ආපසු පැමිණෙන ලදි. | ආර්ථික හා මිල ස්ථායිතාවය පවත්වා ගැනීමට , අනුපාත සුදුසු මට්ටමේ පවත්වාගෙන යාම අවශ්‍ය වේ. |

තැන්පතු පහසුකම් අනුපාතය හා නිත්‍ය ණය පහසුකම් අනුපාතය) බැංකුව ඉහළ දමා තිබුණි. (2021.08.18 හා 2022.01.19 පදනම් අංක 50 බැගින් හා 2022.03.03 පදනම් අංක 100 කින්). මුදල් මණ්ඩලය 2022.04.08 දින පැවති එහි රැස්වීමේදී, ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා මුදල් ප්‍රතිපත්තිය දැඩි ලෙස දැඩි කිරීමේ අරමුණින් බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාත පදනම් අංක 700 කින් ඉහළ දමා තිබූ අතර 2022.07.06 දින පදනම් අංක 100 කින් ඉහළ දමා තිබුණි.

## 3.6 මුදල් සමාගම් ගණන් බේරා වසාදැමීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018, 2019 හා 2020 වර්ෂවලදී බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර අවලංගු කරන ලද මුදල් සමාගම් හතරෙහි ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය (ඇවරකරුවකු පත්කරීම) 2021 අවසන් වන විටත් ආරම්භ කර නොතිබුණි. බලපත්‍රය අවලංගු කළ දින සිට වැඩකරන දින 30 ක් ඇතුළත ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා 2018 මාර්තු 05 දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍ර අවලංගු කරන ලද මුදල් සමාගමට නියෝගයක් කර ඇති අතර එම කාල සීමාව තුළ ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට එම සමාගම අපොහොසත් වී තිබුණි. එසේම, බලපත්‍රය අවලංගු කළ දින සිට වැඩකරන දින 30 ක් ඇතුළත ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා 2018 ජූලි 25 දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රය අවලංගු කරන ලද තවත් මුදල් සමාගමකට නියෝග කර ඇති අතර එම කාල සීමාව තුළ ගණන් බේරා වසා දැමීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීමට එම සමාගම අපොහොසත් වී ඇත. | 2018 දී බලපත්‍රලාභී මුදල් සමාගම් දෙකක බලපත්‍ර අවලංගු කළ පසු එම සමාගම් ගණන් බේරා වසා දැමීම සඳහා වාණිජ මහාධිකරණයේ පෙත්සම් ගොනු කිරීමේ අරමුණින් නීතිපති දෙපාර්තමේන්තුව සමඟ බැංකුව සාකච්ජා පැවැත්වීය. නීතිපති දෙපාර්තමේන්තුව සමඟ පැවැති සාකච්ජාවලින් පසු නව හිමිකම්පෑම්වල ප්‍රමුඛතාවය නිකුත් කරන තුරු කිසිදු ගණන් බේරා වසා දැමීමේ පෙත්සමක් අධිකරණයේ ගොනුගත නොකිරීමට තීරණය කරන ලද අතර ඊට හේතු වූයේ හිමිකම් පෑම්වල ප්‍රමුඛතාවය නිකුත් කිරීමට පෙර ගණන් බේරා වසා දැමීම සඳහා අයදුම්පත් ගොනු කිරීමෙන් ගණන් බේරා වසා දැමීම සඳහා සමාගම් පනතේ නව වන උපලේඛනය අනුගමනය කිරීමට සිදු වන නිසාවෙනි. 2007 අංක 7 දරන සමාගම් පනතේ නව වන උපලේඛනය වෙනුවට 2019 අංක 1 දරන මුදල් ව්‍යාපාර නියෝග (මුදල් සමාගමක් ගණන් බේරා වසා දැමීමේදී හිමිකම් පෑම්වල ප්‍රමුඛතාවය සම්බන්ධයෙන් වන) 2019.05.31 දින මුදල් ඇමතිවරයා විසින් ගැසට් කරන ලදි. ඒ අනුව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා බලපත්‍රලාභී මුදල් සමාගම් දෙකක් ගණන් බේරා වසා දැමීම සඳහා 2019 දී හා 2020 දී පෙත්සම් ඉදිරිපත් කරන ලදි. තවද, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් ගණන් බේරා වසා දැමීමේ පෙත්සම් ගොනු කළ මුදල් සමාගම් 3 ක් සඳහා වාණිජ මහාධිකරණයට සුදුසු ඇවරකරුවෙකු දැනටමත් යෝජනා කර ඇත.<br>ඒ අනුව, සඳහන් කරන ලද ගණන් බේරා වසා දැමීම සඳහා අයදුම්පත් ගොනු කිරීමේ ප්‍රමාදය දැන් විසඳා ඇති අතර නීතියේ ඇති අඩුපාඩු සහ මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගම්වල ඇවර කරන සිදුවීම් මෙහෙයවීමේ පළපුරුද්ද නොමැති වීම ප්‍රධාන වශයෙන් ප්‍රමාදයට හේතු විය. | ක්‍රියාවලිය වේගවත් කිරීම අවශ්‍ය වේ. |

## 3.7 අභ්‍යන්තර අරමුදල් හසුරුවන බැංකුවේ දෙපාර්තමේන්තු විසින් කරන ලද ආයෝජනයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නිශ්චිත ප්‍රාථමික අළෙවිකරුවකු සමඟ ආරක්ෂණයන් නොමැති ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල ආයෝජනයන් හේතුවෙන් බැංකුවේ දෙපාර්තමේන්තු හතරක් විසින් කළමනාකරණය කරන අරමුදල්වලට 2018.12.10 දිනට රු. මිලියන 2,586 ක අලාභයක් සිදුවිය. 2020 සැප්තැම්බර් 18 දිනට එම ප්‍රාථමික අළෙවිකරුගෙන් ලැබිය යුතු ලෙස නැවත වර්ගීකරණය කරන ලද ආයෝජනයේ වටිනාකම රු. මිලියන 2,953.6 ක් විය. | නිශ්චිත ප්‍රාථමික අළෙවිකරු සමඟ තිබූ අදාල ආයෝජන සඳහා සම්පූර්ණ ප්‍රතිපාදන 2020 වන විට කරන ලද අතර එබැවින්, දැනට අදාල අරමුදල්වල මූල්‍ය ප්‍රකාශනවලට බලපෑමක් නොමැත.<br>ලැබිය යුතු රු.2,953.6 ක මුදල ආදල ප්‍රාථමික අළෙවිකරුගෙන් අයකර ගැනීමට බැංකුව දැනටමත් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.<br>තවද, ඉදිරියේදී එවැනි සිදුවීම නැවත ඇතිවීමේ අවදානම අඩුකිරීමට පියවර ද ගෙන ඇත. | අලාභය අයකර ගැනීම අවශ්‍ය වේ. |